# ජාතික අධ්‍යාපන ආයතනය
# මහරගම
# උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව
## SLQF Level - 03
## Diploma in Counselling 2026/2027

ජාතික අධ්‍යාපන ආයතනයේ මාර්ගෝපදේශ හා උපදේශන අංශය විසින් මෙහෙය වනු ලබන උක්ත පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පාඨමාලාවේ ස්වභාවය**

- උක්ත පාඨමාලාව අධ්‍යයන සම්භාර 31කින් සමන්විත එක් අවුරුදු සති අන්ත අර්ධ කාලීන පාඨමාලාවකි.
- සම්මිශ්‍රිත ක්‍රමය අනුව සම්මුඛ සැසි මගින් (40%) හා මාර්ගගත ව (60%) පවත් වනු ලබන මෙම පාඨමාලාව සීමාවාසික පුහුණුවකින් ද සමන්විත ය.
- සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව පැවැත්වේ.

**02. අයදුම් කිරීම සඳහා සුදුසුකම්**

- රාජ්‍ය/අර්ධ රාජ්‍ය/පෞද්ගලික පාසල්වල ගුරුවරයෙකු වීම

හෝ

- රාජ්‍ය/පෞද්ගලික අංශයේ උපදේශන විෂය ක්ෂේත්‍රයේ සේවයෙහි නිරත වීම (සේවා සහතිකය ඉදිරිපත් කළ යුතු ය.)

හෝ

- අ.පො.ස. (උසස් පෙළ) සමත් පෙර පාසල් ගුරුවරයෙකු ලෙස සේවය කිරීම (සේවා සහතිකය ඉදිරිපත් කළ යුතු ය.)
- 2026/04/10 දිනට වයස අවුරුදු 55ට අඩු වීම

**03. පාඨමාලාව සඳහා තෝරා ගැනීම**

- පාඨමාලාලාභීන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

**04. ගාස්තු**

අයදුම්පත් සඳහා : රුපියල් 500/-

ලියාපදිංචි ගාස්තු : රුපියල් 1,000/-

පාඨමාලා ගාස්තු : රුපියල් 40,000/- (මෙය අවස්ථා දෙකක දී සමාන වාරිකවලින් ගෙවිය හැකි ය.)

**05. පාඨමාලාව පැවැත්වෙන ස්ථානය** : ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

**06. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

- ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස පාඨමාලාව සඳහා අයදුම්පත් යොමු කළ යුතු ය. https://www.exams.nie.lk/intakes/new
- අයදුම්පත් යොමු කිරීමේ දී පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

teachmore.lk

- https://www.exams.nie.lk/intakes/new වෙබ් අඩවියට ප්‍රවේශ වී (sign up) අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න. එහි දී ඔබට ලැබෙන පරිශීලක අංකය (User ID) සටහන් කර තබා ගන්න. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුරපදය (Password) සටහන් කර තබා ගන්න.
- වෙබ් අඩවියේ දකුණු පස ඉහළ දැක්වෙන කොටු දෙකෙහි පරිශීලක අංකය හා මුරපදය යොදා ඇතුළත් වන්න (Log in).
- ඔබ පිළිබඳ තොරතුරු (User profile) සම්පූර්ණ කරන්න.
- නව ප්‍රවේශ (New enrollment) වෙත පිවිසෙන්න.
- ඔබට නියමිත පාඨමාලාවේ අයදුම්පත්‍රයට ප්‍රවේශ වන්න (My application).
- අයදුම්පත්‍රයේ දක්වා ඇති තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කර බලා අයිතම අංක 06 යටතේ පාඨමාලාව පැවැත්වෙන මාධ්‍යය තෝරාගෙන අයදුම්පත්‍රය යොමු කරන්න.
- අදියර 2 (STEP 2 payment) සඳහා ප්‍රවේශ වන්න. මෙහි දී ඔබ වෙත ලැබෙන ගෙවීම් යොමු අංකය (Payment reference number) යොදා ඕනෑම මහජන බැංකු ශාඛාවකින් අයදුම්පත්‍ර ගාස්තු රු.500/- ක මුදල ගෙවන්න.
- සම්පූර්ණ කර යොමු කරන ලද අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගන්න.
- අයදුම්පත් යොමු කිරීම සඳහා තාක්ෂණික සහාය අවශ්‍ය වන්නේ නම් 0117601776/ 0117601777 දුරකථන අංකයන්ට ද වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් 0117601752 දුරකථන අංකයට ද සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා අමතන්න.

07. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2026/04/10**

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

අයදුම් කිරීමේ මාර්ගෝපදේශය සඳහා මෙම QR කේතය ස්කෑන් කළ හැකි ය.

teachmore.lk